# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2002/62 - 2017 ජනවාරි මස 20 වැනි සිකුරාදා - 2017.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රාදේශීය ලේකම් ගේ ගොනු අංකය*: DS/HAB/LAN/02/01/31.

*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය*: 4-3/6/2015/HW/309.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය:*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 156, අහංගම නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගොවියාපාන ගමේ පිහිටි ගා/4220 දරන මූලික පිඹුරේ කැබලි අංක 01, 02 හා 03 වශයෙන් පහත විස්තර කෙරෙන ඉඩම් කොටස්.

කැබලි අංක 01

ඉඩමේ නම: ඔරුතොටවත්ත; විස්තරය හා හිමිකම් කියන අය: විවෘත මුඩු බිම, එච්. ඩබ්. එම්. ඒ. ගුණසේකර, මාතර පාර, ගොවියාපාන, අහංගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0007.

කැබලි අංක 02

ඉඩමේ නම: ඔරුතොටවත්ත; විස්තරය හා හිමිකම් කියන අය: විවෘත මුඩු බිම, එච්. යූ. පී. ප්‍රියන්ත, මාතර පාර, ගොවියාපාන, අහංගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0046.

කැබලි අංක 03

ඉඩමේ නම: ඔරුතොටවත්ත; විස්තරය හා හිමිකම් කියන අය: විවෘත මුඩු බිම, පී. කේ. ඒ. පී. ප්‍රනාන්දු, 118, වැවල, ජාඇල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003.

ඉහත සඳහන් ඉඩම් කැබලිවලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සබඳකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් 2017 මාර්තු මස 07 වැනි දින පූ.භා. 10.00 ට හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 පෙබරවාරි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්,



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිය තහවුරු කිරීම සඳහා ඔබ වෙත ඇති සියලුම ඔප්පු හා ලියවිලිද, ඊට අදාළ පත්‍රිරු පිටපත්ද, පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

තරංගා වික්‍රමරත්න,,
ප්‍රාදේශීය ලේකම්,
හබරාදුව,
ගාල්ල දිස්ත්‍රික්කය.

2017 ජනවාරි මස 17 වැනි දින,
හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 - 298

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොලොන්න කෝරලේ සුළු කොට්ඨාසයේ, හිගුර ගමේ, මැනුම්පති විසින් පිළියෙළ කර ඇති වාරිමාර්ග මූලික පිඹුරු අංක 1/40/40 පිඹුරේ සඳහන් කැබලි සඳහා මා විසින් අංක 1955/24 හා 2016.02.26 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තිය යටතේ වන දැන්වීමෙහි 5413 වැනි කැබැල්ලෙහි අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 0.1092 ලෙස සඳහන් වේ. මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2016.11.16 වැනි දින සකස් කර ඇති සංශෝධිත කැබලි විස්තර ලේඛනයට අනුව එය හෙක්. 0.0065 ලෙස සඳහන් විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

වසන්ත ගුණරත්න,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
ඇඹිලිපිටිය.

2017 ජනවාරි මස 18 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඇඹිලිපිටිය.

02 - 299

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.